**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 09 ඡේදය ප්‍රකාරව මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් සඳහා වූ ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස සැලකිය යුතු වුවත්, මාස 03 කට අඩු රු.144,925,413 ක් වූ ආයෝජන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් වලට සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. | මෙම මුදල්, මුදල් හා සමාන දෑ ලෙස පෙන්වීමෙන් රාජ්‍ය ආයතනයක මුදල් ශේෂය අධික ලෙස පවත්වාගෙන යන බවට වැරදි චිත්‍රයක් නිරූපනය විය හැකි බැවින් ආයෝජන ලෙසම දැක්වීම වඩාත් විචක්ෂණශීලී වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදයට පටහැනිව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී නිල නිවාස පිහිටි ඉඩම හා පොලිස් නිල නිවස පිහිටි ඉඩම ප්‍රත්‍යාගණනය නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එකතු පිරිවැය රු.15,213,947 ක් ලෙස දක්වා තිබුණි. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් සහ ඉඩම අත්පත් කර ගැනීම දෙකම සිදු වී ඇත්තේ 2023 වර්ෂයේ බැවින් ඒම වත්කම් වල ඉහත අගයන් අතර ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැති බැවින් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රායෝගික නොවන අතර ඒවා පිරිවැය මත අගය කිරීම වඩාත් විචක්ෂණ ශීලි බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුම් 02කට සෘජුව බැරකර තිබූ එකතු වටිනාකම රු.2,429,951 ක් මාස 01 සිට වසර 02 අතර කාල පරාසයක සිට නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණි. | කාලීනව අදාළ පාර්ශව විසින් තම තැන්පත් පිළිබඳව පසුව කරනු ලබන විමසීම් වලදී එම වටිනාකම් හදුනාගෙන අදාළ ලෙජර් වලට මාරු කිරීමට කටයුතු කරනු ලබන බව. | සෘජු බැරකිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ (CDCE) ඉදිකිරීම් කටයුතු අවසන් කර 2023 ජනවාරි 20 දින සිට භාවිතයට ගනිමින් පැවතියද එම ගොඩනැගිල්ල වෙනුවෙන් තවදුරටත් ගෙවිය | පිළිගනිමි.<br>අදාල ව්‍යාපෘතියේ බිල්පත් වටිනාකම් 2023.12.31 දිනට සහතික කිරීම් කටයුතු සිදු වී නොමැති බැවින් ඒවා උපචිත කිරීම | වත්කම් වගකීම්, වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු රු.12,363,765 ක් හා රු.3,295,900 ක වැට් මුදල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ගොඩනැඟිලි වටිනාකම රු.15,659,665 ක් අඩුවෙන් ද උපචිත වියදම් රු.12,363,765 ක් අඩුවෙන්ද, සවලීකරණ අත්තිකාරම් රු.3,295,000 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. එමෙන්ම මෙම ගොඩනැඟිල්ලට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය රු.740,080 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සිදු කල නොහැකි බව. | |
| (ඇ) | වැඩ නිමකර භාවිතයට ගනිමින් පැවති එකතුව රු.8,011,381 ක් වූ ගොඩනැඟිලි 02 ක් ජංගම නොවන වත්කම්හි දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබීම නිසා එම වටිනාකමින් කෙරීගෙන යන වැඩ වැඩියෙන් හා දේපළ, පිරියත හා උපකරණ අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම එම ගොඩනැඟිලිවලට අදාළ සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.400,569 ක් හා රු.403,909 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙය ගිණුම්කරණ දෝෂයක් වන අතර මේ වන විට එම වරද නිවැරදි කර ඇති බව. | ගිණුම්කරණ දෝෂ ඇති නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 29 වන දින මහජන බැංකුවේ ජංගම ගිණුමෙන් ලංකා බැංකුවේ ජංගම ගිණුම වෙත මාරුකරන ලද රු.7,000,000 ක මුදල, මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ නොදක්වා විවිධ අත්තිකාරම් සහ ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | මෙය ගිණුම්කරණ දෝෂයක් වන අතර නිවැරදි කර ඇති බව. | ජංගම ගිණුම් අතර මාරුකරන ලද මුදල්, මුදල් හා මුදල් වලට සමාන දෑ යටතේ මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ තොගය තොග සමීක්ෂණ වාර්තා තොගය සමඟ සැසඳීමේදී ගබඩා 4 ක තොගයෙහි රු.976,716 ක නොසැසඳීමක් පැවතුණි. | මෙම වෙනස පැන නැග ඇත්තේ කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය තොග වලින් බව. | තොග සමීක්ෂණයෙන් පසු ලබාගන්නා නිවැරදි ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ තොගය මූල්‍ය ප්‍රකාශන අනුව හා තොග සමීක්ෂණ වාර්තා අනුව සැසඳීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම තොගය රු.1,005,353ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම භාණ්ඩ පිළිබඳ නැවත ඇගයීමකට ලක් කර සත්‍ය වශයෙන් උපයෝජනයට ගත නොහැකි භාණ්ඩ මුදල් රෙගුලාසි අනුව අදාල පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව. | කල් ඉකුත් වූ තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ලැබිය යුතු ශේෂයන්ගේ වැඩිවීම | මෙය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දී සිදු වී ඇති ද්විගණන දෝෂයක් වන අතර මෙය නිවැරදි | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි ආකාරයෙන් ඉදිරිපත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | රු.55,216,542 ක් ලෙස දක්වා තිබුණ ද, එහි වැඩිවීම් රු.50,085,842 ක් වූ බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය රු.5,130,700 ක් වැඩියෙන් දක්වා තිබුණි. | කිරීමට කටයුතු කර ඇති බව. | කටයුතු කල යුතුය. |
| (ඍ) | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කරන ලද ව්‍යවහාරික පීඨයේ ඉඩමේ ප්‍රත්‍යාගණිත අගය ගිණුම්ගත කිරීමේදී එම ඉඩමේ රු.2,383,259ක් වූ පිරිවැය සැලකිල්ලට නොගෙන සම්පූර්ණ ප්‍රත්‍යාගණිත මුදලම ගිණුම්ගත කිරීම නිසා දේපළ, පිරියත, උපකරණ ශේෂය හා ප්‍රත්‍යාගණන අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පිළිනොගනිමි. ව්‍යවහාරික පීඨ ඉඩම් වල කිසිදු වටිනාකමක් ඉඩම් ආරම්භක වටිනාකම තුල අන්තර්ගත නොවන බව. | ඉඩමේ පිරිවැය සැලකිල්ලට ගෙන ගිණුම්ගත කල යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ ප්‍රත්‍යාගණන වාර්තා අනුව වාහනවල ප්‍රත්‍යාගණන අගය රු.121,288,000 ක් වුවද එම වටිනාකම ගිණුම්ගත කිරීමේදී රු.126,388,000 ක් ලෙස සටහන් කිරීම නිසා ප්‍රත්‍යාගණන අතිරික්තය හා වාහනවල වටිනාකම රු.5,100,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් ප්‍රකාශනවල සඳහන් ප්‍රත්‍යාගණිත අගය රු. 126,388,000 නිවැරදි බව. | ප්‍රත්‍යාගණන අගයන් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු.1,163,655 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා වර්ෂ 02 සිට වර්ෂ 13 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.59,819,645 ක් වූ කොන්ත්‍රාත් හා විවිධ රඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේවායේ නිදහස් කිරීම ක්‍රමානුකූලව සිදුවෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 ඡේදය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සියලු දෙනා පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද, අධ්‍යයන කාර්යය මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.274,616,654 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,452,634 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ ඌණතාවය රු.263,164,020 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂයේ වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිහින්තලය පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් රු.52,703,236 කට අදාළ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 23 වන දින පිරිනමා තිබුණු අතර ඒ වෙනුවෙන් සවලීකරණ අත්තිකාරම් ලෙස රු.15,859,979 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් කල වැඩ වටිනාකම රු.10,620,619 ක්ව පැවතියදී නියමිත පරිදි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 දින ගිවිසුම අවසන් කර තිබුණි. එදිනට රු.15,760,611 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතු වුවත් රු.3,952,742 ක් වූ අත්තිකාරම් බැඳුම්කරය හා රු.10,540,647 ක් වූ කාර්යයසාධන බැඳුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට හැකියාව තිබියදීත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර විශ්වවිද්‍යාලයට රු.15,760,611 ක පාඩුවක් සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් විගණිත දින වූ 2024 අප්‍රේල් 01 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඇපකරවල කාලය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු DFCC බැංකුව වෙත දන්වා යවා ඇති ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ව්‍යාපෘතිය දිගින් දිගටම අඩු ප්‍රගතියක් පෙන්වා ඇති අතර 2018 අගෝස්තු කොන්ත්‍රාත්කරුගේ පැවැති මූල්‍ය අපහසුතා නිසා අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | අත්තිකාරම් සුරක්ෂණය හා කාර්යයසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට නොහැකිවීම නිසා සිදුවී ඇති පාඩුව අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම්ගත මුදල රු.42,979,355 ක් වූ වෛද්‍ය පීඨයේ ද්විත්ව නිල නිවාස 03 ක් සැලසුම් කර ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2017 මැයි 30 දින ආරම්භ කර අවස්ථා කිහිපයකදීම දින දීර්ඝ කිරීමෙන් පසු 2019 අප්‍රේල් 19 වන විට අවසන් කල යුතු විය. එහෙත් රු.29,239,233 ක කල වැඩ වටිනාකමින් අනතුරුව කොන්ත්‍රාත්කරු ඉදිකිරීම අතහැර තිබුණු අතර, ඒ දක්වා කොන්ත්‍රාත්කරුට රු.21,798,120 ක් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.2,148,967 ක් වූ කාර්යයසාධන සුරක්ෂණය හා රු.9,885,251 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය පිළිවෙලින් 2020 ජනවාරි 08 | කොන්ත්‍රාත්කරුගේ පැවති මූල්‍යාම අර්බුද නිසා නියමිත දිනයන්හිදී නිම කිරිමට නොහැකි වීම නිසා ද්‍රවශීලතා හානි ලෙස රු 4,297,935.50ක මුදලක් කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව කොන්ත්‍රාත්කරුගෙන් අය කරගෙන ඇත. මේ වන විට කොන්ත්‍රාත්කරුට මෙම | අත්තිකාරම් සුරක්ෂණය සහ කාර්යයසාධන සුරක්ෂණය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු නොකිරීම නිසා රජයට සිදු වූ අලාභය වෙනුවෙන් වගකිව යුතු |

| | | | |
|---|---|---|---|
| | දින හා 2019 ජුලි 30 දින කල් ඉකුත්වී තිබුණු බැවින් එම සුරක්ෂණ මඟින් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් විගණිත දින වූ 2024 අප්‍රේල් 01 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකිවීම නිසා අන්නෝන්‍ය අවසන් කිරීමක් සඳහා අවසන් බිල්පත් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පරිශ්‍රවල 2023 මාර්තු 01 දින සිට 2024 පෙබරවාරි 28 දින දක්වා කාලයට අදාළ ආරක්ෂක සේවාවන් සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය, 2.11.3 ඡේදය, 7.9.11 (අ) සහ (ඇ) ඡේදය 8.8.2 ඡේදය සහ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥා පනතේ පඩි පාලක සභා 44 ක විධිවිධානයන්ට පටහැනිව රු.58,044,125 ක් වූ අවම මිල ඉදිරිපත් කළ ආයතනය තාක්ෂණික කමිටු සාමාජිකයින් 04 දෙනෙකු විසින් ප්‍රශස්ථම ලංසුව ලෙස නිර්දේශ කර තිබුණි. එහෙත් තාක්ෂණික කමිටු එක් සාමාජිකයෙකු විසින් ලංසු ලේඛනවල සඳහන් නොවූ ඇගයීම් නිර්ණායකයක් පදනම් කර ඉදිරිපත් කරන ලද නිර්දේශයට අනුව රු.63,929,750 ක් වූ දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනය පිළිගැනීම නිසා විශ්වවිද්‍යාල අරමුදලට රු.5,885,625 ක පාඩුවක් සිදු වී තිබුණි. | 2022 ඔක්තෝබර් 26 දින සිට 2023 පෙබරවාරි 07 දින දක්වා කාලය සති 15ක් බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 හි කාලරාමුවට අනුකූලව කටයුතු කර නොමැති බව.<br>2023.01.30 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය සමඟ එකඟ නොවූ නිලධාරියාගේ ගණනය කිරීම නිවැරදි බවත් එම තීරණය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සභාපති විරෝධතාවක් නොදක්වා ඒ සමඟ එකඟ වී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සිදුකරන ලද බව.<br>එම නිසා සේවකයෙකු සඳහා එක් සේවා මුරයකට ගෙවිය යුතු මුදල සේවකයෙකු සඳහා ගෙවිය යුතු අවම දෛනික වැටුප සලකා ගණනය කිරීම් සිදු කර ඇති බව. | විශ්වවිද්‍යාල අරමුදලට පාඩු ඇති නොවන අයුරින් වඩාත් වාසිදායක තීරණ ගත යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.10 වගන්තිය ප්‍රකාරව ලබා ගන්නා ලද පර්යේෂණ අත්තිකාරම් දින 90 ක් තුළ පියවිය යුතු වුවද, කථිකාචාර්යවරුන් 12 දෙනෙක් වෙත ලබා දී තිබූ එකතුව රු.1,227,223 ක් වූ අත්තිකාරම් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 13 දක්වා කාල පරාසයක් ගතවී තිබුණද එම අත්තිකාරම් පියවා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | 2024 වර්ෂයේ දී නිරවුල් නොකරන්නේ නම් අදාළ නිළධාරීන්ගේ වැටුපෙන් අඩුකිරීමට කටයුතු කරනු ලබන බව. | අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2009 ජනවාරි 07 දිනැති අංක 904 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛයට අනුව විදේශ ගත කිරීමට පෙර බැඳුම්කරයකට යටත් වි යුතු වුවද 2022 සහ 2023 වර්ෂයේ පැවති Enhancing Governance, Government Management and Reform in Sri Lankan Universities through Non-Academic Staff Training (ENACT) වැඩසටහන සඳහා එපරිදි කටයුතු නොකල කළමනාකරණ සහකාර නිලධාරියෙකු නැවත නොපැමිණීම නිසා ඔහුගෙන් විශ්වවිද්‍යාලයට අයකරගත යුතුව තිබූ රු.1,659,877 ක මුදල අයකර ගැනීමට කළමනාකරණය අසමත්වී තිබුණි. තවද හවුල්කාර ගිවිසුමේ 13.1 වගන්තියට පටහැනිව විදේශ පුහුණු වැඩසටහන් සඳහා කළමණාකරණය විසින් සුදුසු නිලධාරීන් තෝරා නොගැනීම, ඉල්ලා අස්වීම් අනුමත කිරීම සහ විශ්‍රාම ගැන්වීම තුළ පුහුණුවෙන් පසු වසර 05 ක කාලයක් අනිවාර්යයෙන් සේවය නොකිරීම නිසා විශ්වවිද්‍යාලයට රු.2,097,837 ක පාඩුවක් සිදුවී තිබුණි. | 2023.02.27 වන දින පැවති 264 පාලක සභාව විසින් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කරන ලෙස අනුමත කර ඇත. ඒ අනුව මේ වනවිට පතිනායක මහතාගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු.1,659,877.54ක මුදල ඔහුගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු සිදු වෙමින් පවතින බව. එසේම ඉදිරි පියවරයන් සඳහා උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙතින් විමසීමක් කල බව. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන පරිදි කටයුතු කල යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ රංග ශාලාවේ සිවිලිම 2019 ඔක්තෝබර් 26 දින කඩා වැටීම නිසා එහි තිබූ පුටු 405 ක් ආරක්ෂා කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකිරීම හේතුවෙන් එම පුටු දිරාපත්වී තිබුණි. එම පුටු අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,657,500 ක් වැය කර තිබීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි. | මෙම සිවිලිම කඩාවැටුනු විට දී ඒ සමඟ සිවිලිමේ රැඳී තිබූ වවුලන්ගේ මලද්‍රව්‍ය මෙම පුටු වලට වැටීම මඟින් මෙම කවර දිරාපත් වූ අතර පුටු බාහිර පරිසරයට නිරාවරණය වීමෙන් දිරාපත් වීම කළමණාකරණයේ අකාර්යක්ෂමතාවයන් මඟින් සිදු වූවක් යන්න ප්‍රතික්ෂේප කරන බව. | සිදුවී ඇති අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | බැඳුම්කර ගිවිසුම් කඩ කරන ලද කථිකාචාර්යවරු 09 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දින වනවිට වසර 01 සිට වසර 09 දක්වා කාලපරිච්ඡේදයක් ගත වී තිබූ එකතු වටිනාකම රු.71,332,305 ක් අයවිය යුතුව පැවතුණි. බැඳුම්කර වටිනාකම් කපා හැරීමට ප්‍රතිපාදන සලසා නොතිබිය දී 2023 ජුනි 26 දින පැවති 272 පාලක සභා තීරණයෙන් බැඳුම්කර කඩ කළ කථිකාචාර්යවරු දෙදෙනෙකුගෙන් 2023 ජනවාරි 01 දිනට අයවිය යුතු රු.15,154,309 ක් 2023 වර්ෂය කපා හැර තිබුණි. | අදාල කතිකාචාර්යවරුන් දෙදෙනා ප්‍රමාද වී හෝ ආචාර්ය උපාධි සම්පූර්ණ කර සහතික පත් විශ්වවිද්‍යාලයට භාර දී ඇති බව. | 2022 ජුනි 22 දිනැති අංක 02/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය අනුව කටයුතු කල යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින විශ්වවිද්‍යාලය වෙත කොන්ත්‍රාත් වටිනාකම රු.17,500,000 ක් වූ අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම්ගතව 2021 දෙසැම්බර් 31 දින නිමකර භාරදිය යුතු වුවත්, 2024 අප්‍රේල් 01 දින වනතුරුත් නිමකර විශ්වවිද්‍යාලය වෙත භාරදී නොතිබුණි. | පිළිගනිමි.<br>මෙය මොඩියුල 9ක් සහිතව ක්‍රියාත්මක වන එකක් වන අතර මේ වන විට ඉතා සංකීර්ණ පද්ධති 03ක් ක්‍රියාත්මක කරමින් පවතින බව. | අන්තර් සම්බන්ධතා මෘදුකාංග පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණකාධිපති වෙත 2024 අප්‍රේල් 02 දින ඉදිරිපත් කර තිබුණි. | විශ්වවිද්‍යාලයේ මූල්‍ය නිලධාරින් තනතුරු හිඟය මෙම මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වීමට බලපා ඇති බව. | මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |